**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2024**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා වසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීමෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, හෝ විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු.742,035,590 ක දේපල පිරියත, උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයේ පැවතුණි .ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2023 දෙසැම්බර් 15 දින නිකුත් කරන ලද පැහැදිලි කිරීම් වලට අදාළව දැනටමත් ධාරණ අගය ශුන්‍ය අයිතමයන් තවදුරටත් එලෙසම පවත්වා ගෙන යා හැකි බවත් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල ධාරණ අගය ශුන්‍ය ලෙස හෙළිදරව් කිරීමක් සිදුකොට ඉදිරිපත් කර ඇති බව. | ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාට්‍ය හා නර්තන කලා පීය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ප්‍රමාද වීම මත 2023 සහ 2024 වර්ෂවල කොන්ත්‍රාත්කරුවකුට ගෙවන ලද ප්‍රමාද ගාස්තු රු.40,750,130 ක ප්‍රමණය අලාභයක් වුවත් එය ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබීමෙන් එහි ශේෂය එම අගයෙන් මෙන්ම ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය පිළිවෙලින් රු.28,734,873 කින් හා | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි ඡේද අංක 35 හි වත්කමක පිරිවැය මැනීමේදී, “ගෙවීම් සාමාන්‍ය ණය කොන්දේසි වලින් ඔබ්බට විලම්භණය කරනු ලබන්නේ නම් මුදලට ගැණුම් මිල හා මුළු ගෙවීම් අතර වෙනස ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 04 ප්‍රකාරව විකල්ප ක්‍රමය භාවිතා කරන්නේ නම් හැර අදාළ වියදම පොලී වියදම ලෙස හඳුනාගත යුතුය.” මේ අනුව ඉඩදුන් විකල්ප ක්‍රමය යටතේ රු.40,750,130 ක් වූ පොළී වියදම | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.11,015,257 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රාග්ධනිත කර ඇති බව. | |
| (ආ) | දීර්ඝ කාලය සිට පැවත එන නිරවුල් නොකල ප්‍රාග්ධන අත්තිකාරම් ගිණුමේ රු.2,759,624 ක් වූ ශේෂයට අදාල උපලේඛන හා විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | දීර්ඝ කාලීන ශේෂයන් හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ සිට පැවත එන රු.4,709,495 ක ශිෂ්‍යාධාර ගිණුමෙහි ශේෂය ගෙවිය යුතු සිසුන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට සටහන් කර ගත් බව. | පැරණි ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගෙවිය යුතු වෙනත් වියදම් ලෙස ඉකුත් වර්ෂයේදී හඳුනාගත් රු.11,536,153 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ පරිසංවාද හා අදාළ සම්මන්ත්‍රණ සඳහා ලද මුදල් සඳහා තවදුරටත් ගෙවිය යුතු වියදම් හඳුනාගැනීමට අදාළ අංශ හා පීඨ මගින් සනාථන ලිපි මේ වනවිට ඉල්ලුම් කර ඇති අතර එම ලිපි ලද පසුව ඒ අනුව කටයුතු කරනු ලබන බව. | එම |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103,104 | අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව අනාවරණය වී තිබූ රු.1,097,359 ක් පමණ වටිනා පුස්තකාල පොත් 3,940 ක් අස්ථානගත වීමට අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | UGC Commission Circular 01/2022 ට අනුව මේ වන විට 2024 වර්ෂය සඳහා වන තොග සංගණනය සිදු කර ඇති අතර ඒමගින් එතෙක් කරන ලද සංගණනවල පැවති දුර්වලතා මගහරවා ගැනීමටත් අදාළ අස්ථානගතවීම් පිළිබඳව වගකිව යුත්තන් හඳුනා ගැනීමටත් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරිමටත් අපේක්ෂා කරන බව. | අස්ථානගතවීම් පිළිබඳව සොයා බලා වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (viii) ඡේදය | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති සුභසාධන වැඩසටහන් වෙනුවෙන් සිදුකරන වෙන් කිරීම් නතර කළ යුතු වුවද අනුමැතියකින් තොරව සේවක සුභසාධන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කර තිබූ සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු. 1,836,125 ක් ගෙවා තිබුණි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ සහ 2020 ඔක්තෝබර් 13 දිනැති අංක 07/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂ් සභා මූල්‍ය චක්‍රලේඛයේ විධිවිධාන යටතේ රක්ෂණ පහසුකම් සැපයීම සිදු කෙරේ. ඒ සඳහා විශ්වවිද්‍යාලය හා සේවකයා පිලිවෙලින් සියයට 59 ක හා 41 ක ප්‍රමාණයක් දායක වෙයි.<br><br>මේ සඳහා මුදල් කමිටු සහ පාලන සභා අනුමැතිය සහිතව විශ්වවිද්‍යාලයේ ඇති සන්නිවේදන කුළුනු මාර්ගයෙන් උපයාගෙන ඇති ආදායම ලබාගන්නා බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 වන ඡේදය | බැඳුම්කර කඩ කිරීම් තුලින් ආචාර්යවරයෙකුගෙන් අයකරගෙන තිබූ රු.970,068 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරුන්ගෙන් අයකරගන්නා ලද මුදල් විශේෂිත අරමුදලක් (Restricted Funds) යටතේ පවත්වාගෙන යනු ලබන බව. | එම |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 103,407,441 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 65,562,142 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 37,845,299 පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රදාන අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.1,022,650,000 ක් වූ ඉඩම් කැබලි 03ක් නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු මේ දක්වා අවසන් කර නොතිබුණි. | ඉඩම් කොටස් තුනෙන් එක් කොටසක හිමිකාරීත්වය විශ්වවිද්‍යාලය අත්පත් කරගෙන ඇති අතර අනෙක් ඉඩම් කොටස් දෙකේ හිමිකාරීත්වය අපේක්ෂාවෙන් පවතී. මේ සඳහා නීති අංශය අදාළ රාජ්‍ය ආයතන සමඟ අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | නීත්‍යානුකූල හිමිකම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේදී නාට්‍ය හා නර්තන පීඨයට බදු පදනම මත ලබාගන්නා ලද ගොඩනැගිල්ලක් සඳහා වසර 02 ක කුලිය ඇතුළුව අනෙකුත් ආරම්භක වියදම් සමඟ එකතුව රු.116,845,954 ක් වැය කර තිබුණු අතර වසරක කාලයකට පසුව ප්‍රදේශවාසීන් විසින් අධික බෙර ශබ්දය සම්බන්ධයෙන් කරන ලද පැමිණිලි හේතුවෙන් වසර 02 කට පසු ගිවිසුම අවසන් කර තිබුණි. විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාව සම්බන්ධයෙන් නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමකින් තොරව මෙම ගොඩනැගිල්ල බද්දට ගැනීම හේතුවෙන් කාමර වෙන්කිරීම (Partition) කාපට් දැමීම වැනි ගොඩනැගිල්ල සුදුසු තත්වයට පත් කිරීම සඳහා දරන ලද රු.28,726,084 ක වියදම අනාර්ථික වී තිබුණි. එසේම එම ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද රු.1,050,000 ක් වූ Exhaust Fan 27ක් හා වායු සමීකරණ යන්ත්‍ර 06 ක් භාවිතා කිරීමකින් තොරව ගබඩා කර තිබුණි. | බදු පදනම මත ලබාගත් දෙහිවල පරිශ්‍රයේ ගොඩනැගිල්ල සිසුන්ට අධ්‍යයන කටයුතු සිදුකිරීමට සුදුසු තත්වයට පත්කිරීම සඳහා කාමර වෙන්කිරීම (Partition) හා කාපට් දැමීම වැනි කටයුතු සිදුකළ යුතුව පැවතුණි. එයින් ඉවත්වීමේදී එම කාපට් නැවත නාට්‍ය හා නර්ථන කලාපීඨයේ භාවිතය සඳහා ලබා දී ඇති අතර කාමර වෙන් කිරීම සඳහා භාවිතා කරන ලද Partition කොටස් නැවත විශ්වවිද්‍යාලය වෙත රැගෙනවිත් ආරක්ෂිතව ගබඩා කරන ලදි. ගොඩනැගිල්ල සුදුසු තත්වයට පත් කිරීම සඳහා දරන ලද පිරිවැය අනාර්ථික වී නොතිබුණි. එසේම වායු සමීකරණ යන්ත්‍ර රැගෙන ඒමෙන් පසුව සිදු කරන ලද තත්ත්ව පරීක්ෂාවට අනුව ඒවා ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති බව තහවුරු වී ඇති බව. | නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමකින් පසුව සම්පත් උපයෝජනය කල යුතුය. |